# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1303/1 – 2003 අගෝස්තු 25 වැනි සඳුදා – 2003.08.25

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

විධාන අංක : 02

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10 (1) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 (1) වැනි වගන්තිය යටතේ ක්‍රියාකරමින්, මෙහි උපලේඛනයේ දැක්වෙන භාණ්ඩ සාදන්නන් සහ වෙළෙඳුන් වෙත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මෙසේ විධාන කරයි :

*භාණ්ඩයේ හෝ ඇසුරුමේ හෝ බහාලුවේ හෝ දවටනයේ,*

(අ) උපරිම සිල්ලර මිල ලකුණු කරන ලෙස ;
(ආ) නිෂ්පාදන කාණ්ඩ අංකය සටහන් කරන ලෙස ; සහ
(ඇ) කල් ඉකුත් වන දින සටහන් කරන ලෙස.

මෙම විධානය 2003 නොවැම්බර් 01 වන දින සිට බලපැවැත්වෙනු ඇත.

උපලේඛනය

ඇසුරුම් කළ මස් හා මස් ආශ්‍රිත නිෂ්පාදන
ඇසුරුම් කළ මාළු සහ අනෙකුත් මුහුදු ආහාර
ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කෑමට ගන්නා තෙල්
තේ ඇසුරුම්
කෝපි ඇට සහ ඇසුරුම් කල කෝපි කුඩු
චොක්ලට්
චට්නි වර්ග, අච්චාරු සහ සෝස් වර්ග
කිරි පිටි (සම්පූර්ණ යොදය සහිත. මේද අඩු ළදරු හා මෝල්ටඩ්)
උකුකළ කිරි
ළදරු ආහාර
රෝගීන්ගේ ආහාර
විස්කෝතු
සිමෙන්ති
කෘෂි පොහොර
කෘෂි රසායන
සිසිල් බීම
ටින් මාළු
අයිස් ක්‍රීම්
ඇසුරුම් කළ හෝ බහාලුම්ගත මිරිස් කුඩු
ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කොත්තමල්ලි කුඩු
ඇසුරුම් කළ හෝ බහාලුම්ගත තුනපහ කුඩු
ඇසුරුම් කළ හෝ බහාලුම්ගත ගම්මිරිස් කුඩු
ඇසුරුම් කළ හෝ බහාලුම්ගත කහ කුඩු
ගොඩනැගිලි කර්මාන්තය සඳහා යොදා ගන්නා තීන්ත වාර්නිෂ් සහ ද්‍රාවක
බහාලුම්ගත ගෘහස්ථ විෂබීජ නාශක
ඇසුරුම් කළ හෝ බහාලුම්ගත ඖෂධ වර්ග සහ විටමින් වර්ග
මාගරින්
බටර්
ටින්කළ පළතුරු
පළතුරු යුෂ හා කෝඩියල් වර්ග
ජෑම් වර්ග, ජෙලි වර්ග සහ මාමලේඩ්
යෝගට්
ආහාර පරිරක්ෂක
ස්වාභාවික යීස්ට් නිස්සාරණ නිෂ්පාදන

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

ආර්. අයි. විමලසේන
සභාපතිනි.

2003 අගෝස්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

09-244


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

1A G-003056—800 (2003/08)